# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO
1191/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No
/ 2024

දිනය
திக
Date
19/07/2024
පැය 1440

## මාධ්‍ය නිවේදනය

**01. නීති විරෝධී ලෙස ගුවන් මගින් මෙරටට ගෙන්වන ලද සිගරට් තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකය.**

2024.07.19 වන දින උදෑසන කාලයේ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත එම නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද සිගරට් 15600 (කාටුන් 78 ක්) සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන කන්තලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - අග්බෝපුර පොලිස් වසම.**

2024.07.19 වන දින අළුයම් කාලයේ අග්බෝපුර පොලිස් වසමේ හබරණ දෙස සිට කන්තලේ දෙසට ධාවනය වූ වෑන් රථයක් අපරික්ෂාකාරී රිය ධාවනය හේතුවෙන් මාර්ගයෙන් ඉවතට පැන දුරකථන රැහැන් කණුවක ගැටී අනතුරක් සිදුවී ඇත. මෙම වෑන් රථයේ රියදුරු ඇතුළු පුද්ගලයින් තවත් පුද්ගලයින් තිදෙනෙකු ගමන් ගෙන ඇති අතර අනතුරින් වෑන් රථයේ ගමන් කරන ලද පුද්ගලයකු තුවාල ලබා කන්තලේ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 65 ක් වූ පානදුර ත්‍රිකුණාමලය පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කන්තලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් වෑන් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර අග්බෝපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**